


මට ආරාධනාවක් ලැබුණා සංස්කෘතික අමාත්‍යාංශයේ ඉසිර ගුවන් විදුලියේ සේවය කරන්න. මම එහි ටික කාලයක් සේවය කර නැවත ඕස්ට්‍රේලියාවට ආවා.

ශ්‍රීනාත්
මේ සමාජ සේවා කටයුතු කිරීම සඳහා ඔබට යම් අනුග්‍රහයක් ලැබෙනව ද?

ගාමිණී
කියන්න සතුටුයි ශ්‍රීනාත් කිසිම් අනුග්‍රහයක් ලැබෙන්නෙ නැහැ. නමුත් යම් කිසි සංවිධානයකට හෝ යම් කිසි කෙනෙකුට ලක්හඬ වැඩිහිටි ව්‍යාපෘතිය සඳහා උදව් උපකාර කිරීමට කැමති නම් මා අමතන්න පුලුවන්. මගේ ඉදිරි බලාපොරොත්තුව මෙහි වෙසෙන සෑම වැඩිහිටියෙකුටම හුදකලාව කාන්සිය මගහරවා ගැනීමට ක්‍රමවත් වැඩ සටහන් කීපයක් සැළසුම් කිරීමයි.

ශ්‍රීනාත්
පවිලේ විස්තර ටිකක් කතා කරමු.
ගාමිණී
මගේ මව පියා සහ නැගනිය ජීවත් වෙන්නේ ලංකාවේ. හැකි හැම වේලාවෙම මම ඔවුන් බලන්නට යනවා. ඒ එක්කම මගේ බිරිඳ ඉන්ද්‍රා පුතුන් දෙදෙනා වන ප්‍රභාත් හා අනුරුද්ධ මගේ වැඩ කටයුතු වලට ලොකු සහයක් ලබා දෙනවා. ඔවුන්ගේ සහයෝගය නොලැබෙන්නේ නම් මේ තරම් සාර්ථකව මේ වැඩ කරගෙන යන්න බැරි"වෙනවා.

ශ්‍රීනාත්
ඔබගේ රැකියාව ලෙස නිරත වන්නෙත් ගුවන් විදුලියම ද?

ගාමිණී
නෑ ශ්‍රීනාත්. මම භාෂා පරිවර්තකයෙකු හැටියට කටයුතු කරනවා. එය රැකියා-වකට වඩා සේවයක් සැළසෙන රාජකාරියක්. මම එය ඉතා සතුටින් කරනවා.

ශ්‍රීනාත්
ඔබේ ඉදිරි බලාපොරොත්තු මොනවා ද?
ගාමිණී
අපේ ලක්හඬ ගුවන් විදුලිය තව තවත් දියුණු කර ගැනීමත් ගුවන් විදුලියෙන් අපේ අසන්නන්ට තව දුරටත් මෙහෙවරක් කිරීමටත් මම බලාරොත්තු වෙනවා. මෙය ඉදිරියට ගෙනයාමට මා සමග අත්වැල් බැඳගෙන සිටින අනෙකුත් සහෝදර ශිල්පීන්වත් මම මේ වෙලාවේ මතක් කරන්න කැමතියි. ඔවුගෙන් ද මට නොමඳ සහයක් ලැබෙනවා.

ශ්‍රීනාත්
ඔබට ලැබුණ සම්මානය ගැන නැවත වාරයක් අපේ සුබපැතුම් පිලිගන්වන්න කැමතියි. මේ කෙටි පිලිසඳරට එක්වුණාට ස්තුතියි. ඔබේ සියලු කටයුතු සාර්ථක වේවා යි සන්නස වෙනුවෙන් මම ප්‍රාර්ථනා කරනවා.

### *නිවැරදි කිරීමක්*

*පසුගිය කළාපයේ ශිරෝමා ප්‍රනාන්දු සමඟ කළ සාකච්ඡාවේ දී ඇය විසින් ස්තුගිය පුද කරන ලද ධම්මි කටුගම්පොල හා ප්‍රේමා කටුගම්පොළ මහත්ම මහත්මීන්ගේ නම් මුද්‍රණ දෝෂයකින් මගහැරී ඇත. ඒ පිළිබඳව අපට සිහිපත් කිරීම පිලිබඳව ශිරෝමාට ස්තුතිවන්ත වෙමු.*




කාලෙකට පස්සෙ අල්ලපු ගෙදර නංගි ආව අපිව බලන්න. ශ්‍රීපාලිට පරණ පුරුද්දට අල්ලපු ගෙදර නංගි යි කියල කිව්වට දැන් අපි දෙගොල්ල ඉන්නෙ හැතැප්ම විස්සක් දුරින්. කට්ටිය කුස්සියේ මේසෙ වටේ වාඩි වෙලා තේ බොන ගමන් හතර දෙනා කතාවට වැටුන.

* * *

''තව හොඳ දෙයක් අහන්නම්" ඒ පාර සිරි. සංග්‍රහ විධික්‍රම ගැන අපේ කට්ටියගෙ කතා මළු ඉවර වෙන්නෙ නෑ වගේ.

''හොඳයි තේ පෝච්චිය පිටින් ගේනව කියමු කෝප්පයි, සීනියි, කිරියි එක්ක වෙන වෙනම. පලතුරු බීම, සිසිල් බීම හෙම දෙනව නම් කොහොමද?"

''අපි නම් බෝතලේ පිටින් ගේනව වීදුරුත් එක්ක ඇති තරම් දගන්න" මං කිව්ව.

''අමුත්තො බීම දගෙන ඉවර උනාට පස්සෙ, බෝතලේ ආපහු අරං යනවද නැතිනම් එතනම තියනවද දෙවෙනි පාරට දගෙන බො-න්න?"

''නැතුව? ඇයි බෝතල් ආපහු අරං යන්නෙ කට්ටිය බීල ඉවර වෙන්න කලින්?" මං ඇහැව්වෙ පුදුමෙන් වගේ.

''හැම තැනම එක වගෙ නෙමේනෙ අක්කෙ, සිරිත් විරිත්" සිරි කියන්න ගත්ත.

''අක්කල අපි එහෙම කරනව, නමුත් සමහර ගෙවල් වල සිරිත නම් බීම වීදුරු වලට දල ගේන එකයි බෝතලේ ෆ්‍රිජ් එකේම තියෙද්දි".

''නිකම් ගොඩ වෙලා එන්න ගියා නම් ප්‍රශ්ණයක් නැහැ, වැඩි වෙලාවක් ඉන්නෙ නැති හින්ද. ඒත් ගියේ කෑම වලට නම්, අපි ඉන්න ඕනෑ කෑම දෙන කල්ම අර එක බීම වීදුරුව බීල".

* * *

''ඇයි, එතකොට බියර්, සැර බීම හෙම?" අපේ එක්කෙනාගෙ ප්‍රියතම මාතෘකාව දැනුයි ආවෙ.

''මට නම් බියර් බොන්න බැහැ බෝතලේ කටට තියල, වීදුරුවක් ඕනැමයි. ඒත් සමහරු තියන්නෙම නැහැනෙ බියර් බොන වීදුරු මේසෙට".

''ඕක මොකක්ද අයියෙ එහෙනම් මේ කතාව අහගන්න" ආපහු සිරිගෙ වාරෙ.

''අපි ගියා පාටියකට යාළුවෙකුගෙ ගෙදර. සිංහල අයත් කිහිප දෙනෙක් හිටිය. අපි විසිපස් දෙනෙක් විතර ඒගොල්ලන්ගෙ විශාල රම්පස් රූම් එකේ වටේට තියල තිබුනු පුටු වල වාඩි වෙලා හිටිය".

''ගෘහ මූලිකය ගෙන් සංග්‍රහ කරන්න අණ ලැබුනට පස්සෙ ඔන්න ගෙදර පිරිමියා කාමරේ වටේට යන්න පටන් ගත්ත බියර්ද සිසිල් බීම ද ඕනැ කියල එක එක්කෙනාගෙන් අහ අහ. මට එහා පුටුවෙ හිටපු මනුස්සය බියර් කියල කිව්වම, එයාට බියර් කුප්පියක් ගෙනත් දුන්න කට තියල බොන්න".

''ඒක දැකපු මං එකපාරටම සිල් අරගෙන මට ඕනැ සිසිල් බීම කියල කිව්ව. මට ලැබුන බීම වීදුරුව, අල්ලපු පුටුවෙ කෙනා බියර් කුප්පිය බොනකම්ම, පැය බාගයක් විතර යනකංම, මං තොල ගගා හිටිය".

''ඔන්න ගෙදර පිරිමිය දෙවෙනි රවුම ආව. අල්ලපු පුටුවෙ කෙනාගෙ හිස් බියර් කුප්පිය අරගෙන ගිහින් අළුත් එකක් ගෙනත් දුන්න. ඊලඟට මා ගාවට ඇවිත්, මගේ හිස් වීදුරුව අරගෙන ගියා. එච්චරයි. ඊට පැය දෙකකටත් වැඩිය ගියාට පස්සෙ කෑම කන වෙලාව එන කම්ම මං ඔහේ තොල් ලෙව කමින් හිටිය."

සිරි ගෙ කතා විලාසයෙන් තේරුනේ එයා තාමත් ඒ ගැන දුක් වෙනව වගෙ.

* * *

''හැබැයි මං එකක් කියන්නම්, සංග්‍රහ කරන අෑයො අඩුවක් පාඩුවක් නොවෙන්න සංග්‍රහ කරන්න දැනගන්න ඕනැ වගේම, සංග්‍රහ භුක්ති විඳින අෑයොත් දැනගන්න ඕනැ දෙන විදියට කාල බීල සතුටු වෙන්න" මම තේ මේසෙ අස් කරන ගමන් කිව්ව.

''ඔව්, ඔව්, රෝමෙට ගියොත් රෝම වැසියෙක් වගේ ඉන්න ඕනි" වෙනද වගේම අදත් අන්තිම වචනය අල්ලපු ගෙදර නංගිගෙන්.

**අල්ලපු ගෙදර අක්කා**

*ලබන කලාපයෙන් නැවත හමුවෙමු.*